**වත්තල ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වත්තල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 දක්වා කරුණු ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල ශුද්ධ මුදල් වැඩිවීම් වටිනාකම රු.125,294,882 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |

1.6.2 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොඩනැගිලි ගිණුමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.447,220,938 ක් සහ උපලේඛන අනුව රු.446,848,115 ක් වූයෙන් රු.372,823 ක වෙනසක් විය. | 2024 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | වෙනස සොයා බලා නිවැරදි කළ යුතුය. |
| (ආ) කාල විශ්ලේෂණ වාර්තාව අනුව රු.89,536,357 ක් වූ හිඟ හිටි වරිපනම් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.85,016,426 ක් වූයෙන් රු.4,519,931 ක වෙනසක් විය. | එම | එම |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වගන්තිය | දේපල 67,377 ක් 2008 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇති බව. | තක්සේරුව සිදුකරවා ගෙන නව රේටයන් අනුව වරිපනම් අය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වටිනාකම රු.643,645 ක් වූ අත්තිකාරම් 2 ක් පියවා නොතිබුණි. | බිල්පත ප්‍රතිපූර්ණය සඳහා නැවත යොමු කර ඇති බව. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග | | | |
| (i) | අංක 08 | මූල්‍ය ප්‍රකාශනය අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කරන ලද්දේ 2024 මැයි 14 දින දීය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අංක 83(ii) | සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2025 අයවැය යෝජනාවට ඇතුලත් කරන බව. | නියෝග අනුව කටයුතු කළ යුතුය. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

### 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.436,438,354 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.263,219,162 ක් විය.

### 2.2 **ආදායම් පරිපාලනය**

#### 2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන් තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 104,501,100 | 113,583,737 | 112,545,390 | 85,016,426 | 94,142,100 | 105,796,333 | 107,098,725 | 83,978,079 |
| (ii) | කුලී | 10,500,000 | 9,767,188 | 10,076,078 | 8,287,644 | 5,640,000 | 11,698,138 | 11,839,872, | 8,596,534 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,840,000 | 2,227,857 | 2,227,857 | - | 3,352,399 | 2,637,349 | 2,637,349 | - |
| (iv) | වෙනත් ආදායම් | 407,500 | 427,594 | 427,594 | - | 765,000 | 2,518,182 | 2,518,182 | - |
| | | ----------- | ----------- | ----------- | ----------- | ----------- | ----------- | ----------- | ----------- |
| | | 117,248,600 | 126,006,376 | 125,276,919 | 93,304,070 | 103,899,499 | 122,650,002 | 124,094,128 | 92,574,613 |
| | | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== |

#### 2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ශේෂය තුල වසර 10 ට වැඩි ශේෂය රු.11,848,422 ක් ද, වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.26,005,921 ක් ද, වසර 3 ත් 5 ත් අතර ශේෂය රු.14,387,366 ක් ද, වසර 1 ත් 3 ත් අතර ශේෂය රු.14,799,389 ක් ද වූ අතර අයකරගැනීම සඳහා දේපල තහනම් කිරීම් කිසිවක් සිදුකර නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිග වරිපනම් ශේෂ අයකර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.83,978,079 ක් වූ හිඟ වරිපනම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුල රු.27,674,227 ක් රැස්කර තිබුණු හෙයින් හිඟයෙන් රැස්කරගත් වටිනාකම සියයට 33 ක් පමණක් විය. | 2024 අප්‍රේල් 30 දින වන විට පැවැති හිඟයෙන් අය කිරීමේ ප්‍රතිශතය 17% ක් බව. | හිඟ වරිපනම් ශේෂ අයකර ගත යුතුය. |

(ආ) කුලී

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.8,596,534 ක් වූ හිඟ කඩ කුලී ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ රැස්කරගත් වටිනාකම රු.2,735,759 ක් වූයෙන් රැස්කරගත් වටිනාකම සියයට 31 ක් වී තිබුණි. | අය කරමින් පවතින බව. | හිඟ කඩ කුලී ශේෂ අයකර ගත යුතුය. |
| (ii) | කාල විශ්ලේෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.7,828,883 ක් වූ හිඟ කඩ කුලී ශේෂය තුල වසර 10 කට වැඩි ශේෂය රු.213,155 ක් ද, වසර 5ක සිට වසර 10 ක් අතර ශේෂය රු.4,132,495 ක් ද, වසර 3 ක සිට වසර 5 ක් අතර ශේෂය රු.1,142,276 ක් ද, වසර 1 ක සිට වසර 3ක් අතර ශේෂය රු.604,713 ක් ද, වසරට අඩු ශේෂය රු.1,736,244 ක් ද වී තිබුණද, කඩ කුලී අයකරගැනීම සඳහා කඩ මුද්‍රා තැබීම හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | කඩ කාමර මුද්‍රා තබා හිඟ කුලී ශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ මස් කඩ බදු කුලී ශේෂය තුල වසර 1 ත් 3 ත් අතර ශේෂය රු.234,777 ක් ද වසරකට අඩු ශේෂය රු.87,268 ක් ද විය. | අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මස් කඩ බදු කුලී ශේෂය අයකර ගත යුතුය. |
| (iv) | වසර 3 ක කාලයක සිට පැවත එන හිඟ සතිපොළ කුලී ශේෂය රු.136,718 ක් විය. | හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ සතිපොළ කුලී ශේෂය අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සිට පැවත එන අයවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය රු.1,419,445 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | වැට් බදු මුදල් නියමිත පරිදි ගෙවීම් කර ඇති බව. | ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ශේෂය තුල වසර 5 ක සිට වසර 10 ක් අතර රු.157,012 ක් ද, වසර 1 ක සිට වසර 3 ක් අතර රු.401,838 ක් ද, වසරකට අඩු රු.1,305,805 ක් ද විය. | ගෙවීමට කටයුතු කරන බව. | ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රුඩ් 2 යි පර්චස් 6.35 ක් වූ ඇලකන්ද වෙළඳ සංකීර්ණ ඉඩමේ වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරුවක් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ඉඩමේ වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

### 3.2. නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපල , පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇලකන්ද වෙළඳ සංකීර්ණ ඉඩම තුල සභාවේ නම ඇතුලත් නාම පුවරුවක් සවිකොට නොතිබුණ අතර නිෂ්කාර්ය කඩ කාමර 15 ක් සහිත මහල් දෙකකින් යුතු අබලන් තත්ත්වයේ පැවති ගොඩනැගිල්ලේ පහත මහල කුණු කසළවලින් ගොඩ ගසා තිබුණි. | මෙහි අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට ප්‍රතිපාදන වෙන්කොට ඇති බව. | පරිශ්‍රය නිසි පරිදි නඩත්තු කර ආදායම් ඉපයීමේ කටයුත්තකට හෝ වෙනත් කටයුත්තක් සඳහා භාවිතා කළ යුතුය. |

### 3.3. වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන්ව ඇති ඉඩම් 45කින් ඉඩම් 33 කට අදාලව අයිතිය තහවුරු වීමේ ඔප්පු අංක ද, ඉඩම් 24 කට අදාලව ඉඩමේ ප්‍රමාණයන් ද සඳහන් කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව. | සභාව සතු ඉඩම්වල හිමිකම් තහවුරු කරගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වෙනත් රාජ්‍ය ආතනවලින් සභාවේ පරිහරණය සඳහා ලැබී තිබූ වටිනාකම රු.42,644,520 ක් වූ, රථ 5 ක් සහ යන්ත්‍රයක් සභාවට පවරාගෙන නොතිබුණි. | නැවත පැවරීමේ ලිපි සම්පූර්ණ කරමින් පවතින බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.4. **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සභාවේ සේවා කාලය වසර 07 ත් 28 ත් අතර කාලයක් සිටි නිලධාරීන් 19 දෙනෙකු සේවා ස්ථාන අතර මාරු කිරීම් සිදුකර නොතිබුණි. | වසර 5ක වැඩි නිලධාරින්ගේ ලේඛනයක් පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් හා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා විශ්‍රාම ගිය, මිය ගිය, සේවය අතහැර ගිය සේවකයන් 10 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයවිය යුතුව පැවති ට සේවක ණය හා අත්තිකාරම් රු.1,473,756 ක් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | සේවක ණය හා අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |